# 14 පූජකවරය

ජනතා සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන දෙකකි.

1. පූජකවරය හෙවත් පූජාත්වරය
2. ආශිර්වාදකාර බන්ධනය


සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන දෙක සෙසු දේව ප්‍රසාද නිධානවලින් වෙනස් වේ. මන්ද යත්, මෙම දේව ප්‍රසාද නිධාන දෙකෙන්;

1. ධර්මදූත මෙහෙවරක් පැවරෙයි
2. දේව ජනතාව ගොඩනගයි
3. අන් අය ගැලවීම තුළින් තම ගැලවීම සලසා ගනියි.

උදාහරණයක් ලෙස, පවුල තුළ උපදින දරුවන් දේව විශ්වාසය තුළ පුරුදු පුහුණු කිරීමේ වගකීම ආශිර්වාදකාර බන්ධනයෙන් දෙමව්පියන්ට පැවරෙයි. ඒ අනුව දෙමව්පියෝ දරුවන් පවුල තුළ ධර්මානුකූල ව හැඩගස්වමින් දේව ප්‍රසාද නිධාන ලබා ගැනීමට යොමු කරති. මෙය පූජකවරය ලැබුවන්ගේ හා දෙමව්පියන්ගේ යුතුකමක් වන්නේ ය. තව ද දේව ජනතාව ගොඩනැගීම සඳහා නව සාමාජිකයන් බිහි කරන්නේ ද පවුල තුළ ය. ඔවුන්ට ප්‍රසාද ස්නාපනය දනය කරන්නේ පූජක ධූරයකට පත් වූ අය විසිනි.

## පූජකවරය

ක්‍රිස්තුන් වහන්සේ අපෝස්තුලුවරුන්ට පවරන ලද ධර්මදූත සේවාව උන්වහන්සේගේ දෙවන ආගමනය දක්වා අඛණ්ඩ ව ඉදිරියට පවත්වා ගත යුතු ය. එය සිදු කරන්නේ පූජකවරය නමැති දේව ප්‍රසාද නිධානය මගිනි. මෙම දේව ප්‍රසාද නිධානයෙහි ධූර 3කි.




පූජකවරයෙහි පූර්ණත්වය හිමිවන්නේ රාජගුරුප්‍රසාදී ධූරයට ය. එතුමාගේ භාරයට පත්කොට ඇති විශේෂ සභාවේ දෘෂ්‍යමාන නායකයා වන්නේ එතුමා ය. අපෝස්තුලුවරුන්ගේ අනුප්‍රාප්තිකයා ලෙස හා රාජගුරු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස අධිකාරී බලයකින් යුතු ව ශුද්ධ වූ සභාවේ දූත මෙහෙයට එතුමා සහභාගි වෙයි.

පූජාප්‍රසාදීතුමන්ලා තම එඬේරික දූත සේවාව කිරීමට රාජගුරුප්‍රසාදීන් වහන්සේලා මත රැඳී සිටිති. රාජගුරුප්‍රසාදීන් වහන්සේලාගේ පත්කිරීම් මත මීසම් සංඝයක් හෝ අපෝස්තලික සේවාවක් හෝ භාර ව කටයුතු කරති.

දේව වාක්‍ය සේවාව, දේව වන්දනාව, එඬේරික පාලනය, දයාවේ සේවාව වැනි අංශවල වැදගත් කටයුතු රාශියක් රාජගුරුප්‍රසාදීන් වහන්සේලාගේ එඬේරික පාලනය යටතේ තේවාචාර්යතුමන්ලා ඉටු කරති.

පූජාප්‍රසාදිවරු කොටස් දෙකකි

| පදවි පූජාප්‍රසාදිවරු | පැවිදි පූජාප්‍රසාදිවරු |
|---|---|
| රදගුරුතුමකුගේ නායකත්වය යටතේ ගිහියා සමග ජීවත් වෙමින් ඔවුන්ට සේවය කරමින්, ඔවුන් සමග දේව රාජ්‍යය කරා ගමන් කිරීමට කැප වී සිටින, පූජකවරය ලැබූ අය ය. | පැවිදි පන්තියේ ශ්‍රේෂ්ඨ පියතුමා යටතේ, නිශ්චිත ව්‍යවස්ථාවක් අනුගමනය කරමින් ස්වර්ගීක ජීවිතය මෙලොව අත්දකින හා ගත කරන පූජකවරය ලැබූ අය ය. |

### පදවි පූජක පොරොන්දු දෙකකි

1. කීකරුකම (කීකරු කමේ ජීවිතයකට පිවිසීම)
2. පූජක බඹසර (බඹසර ජීවිත රටාව)

**1. කීකරුකම යනු :-** රදගුරු පදවිය භාර රදගුරුතුමාටත් එතුමාගේ අනුප්‍රාප්තිකයන්ටත් අවනත වීම යි. මෙම පොරොන්දුව දෙනු ලබන්නේ, පූජකවරය ලබන දිනයේ දී ය.

**2. පූජක බඹසර යනු :-** විවාහ නොවී, තම මුළු ජීවිතය ම දේව රාජ්‍යය උදෙසා කැප කිරීම යි.

### පූජාප්‍රසාදිතුමන්ගේ වගකීම්

- ශුභාරංචිය දේශනා කිරීම
- ජනතාවට සැබෑ එඬේරෙකු වීම : ජනතාවට ඇහුම්කම් දීම, ඔවුන්ගේ අවශ්‍යතා සොයා බැලීම, ගිහි නායකයන්ට අවශ්‍ය නායකත්වය දීම හා ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීම
- දේව වන්දනා මෙහෙයන් පැවැත් වීම : ජනවන්දනාව කිතුනු ජනතාවගේ විශ්වාසයේ ජීවිතයට රුකුලක් වේ. යාච්ඤාවේ ස්ප්‍රීතුවෙන් කිතුනු ජනතාවගේ විශ්වාසය තහවුරු කිරීම මගින්, ඔවුන් තුළ ආධ්‍යාත්මික ප්‍රීතියක් ඇති කිරීම


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

- තම පදවියේ රාජගුරුප්‍රසාදිතුමන් සමග සහයෝගයෙන් කටයුතු කිරිම
- දේව ජනතාවගේ ආධ්‍යාත්මික අවශ්‍යතා සපුරාලීම

**තේවාචාරිවරුන්ගේ වගකීම්**

- දිව්‍ය පූජාව හා ජනවන්දනා මෙහෙයන් තුළ දේව වාක්‍යය දේශනා කිරීම
- දිව්‍ය පූජාවේ හා අනෙකුත් ජනවන්දනා මෙහෙයන්හි දී රාජගුරුප්‍රසාදිතුමාට හා පූජාප්‍රසාදිතුමන්ලාට සහාය වීම
- පිළිවෙත් අනුව ප්‍රසාද ස්නාපනය දනය කිරීම
- විවාහ පිළිවෙත් සිදු කිරීම
- අවමංගල්‍ය පිළිවෙත් සිදු කිරීම
- දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය දනය කිරීම

**පූජාප්‍රසාදින් වහන්සේලා වෙනුවෙන් ගිහියන්ගේ යුතුකම්**

- ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම හා ඔවුන්ට ගෞරව කිරීම
- මීසම් සේවාවන්ට සහාය දීම
- දේව රාජ්‍යය පතළ කිරීමේ කටයුතුවලට සහාය වීම
- ධර්මෝපදේශ සේවාවන්ට සම්බන්ධ වීම
- ජනවන්දනා කටයුතුවලට සහාය වීම
- පොදු වැඩ කටයුතුවල දී සහයෝගය දීම
- ඔවුන් ව නඩත්තු කිරීම හා ආරක්ෂා කිරීම.

**පූජකවරය දානය කරන්නේ;**

පූජාත්වරය දානය කරන්නට බලය ඇත්තේ රාජගුරු ප්‍රසාදින් වහන්සේලාට පමණක් ය. රාජගුරු ප්‍රසාදීන් වහන්සේ අපේක්ෂකයාගේ හිස මත අත් තබා නියමිත වචන උච්චාරණය කරමින් මෙම දේව ප්‍රසාද නිධානය දනය කරයි.

**පූජකවරය ලැබිය හැකි අය**

- ප්‍රසාද ස්නාපනය හා අභිවෘද්ධි ආලේපය ලබා තිබීම
- අවිවාහක ජීවිතයක් ගත කරන හා ජීවිත කාලය තුළ ම එලෙස අවිවාහක ව ගත කිරීමට තීරණය කළ පිරිමි අය (එලෙස අවිවාහක ව ගත කරන්නේ දේව රාජ්‍යය වෙනුවෙනි).
- එවැනි ජීවිතයක් සඳහා දේව කැඳවීමක් ලබා තිබීම
- දෙමාපියන් ආශිර්වාදකාර බන්ධනයේ සක්‍රමේන්තුව ලබා තිබීම
- අපේක්ෂකයා යහපත් චරිතයකින් යුක්ත වීම

- මනා සෞඛ්‍ය තත්ත්වයක සිටීම
- අවැසි පුහුණු වීමේ කාලය සම්පූර්ණ කර තිබීම
- නිදහස් කැමැත්ත.

පූජකවරයේ පූර්ණත්වය හිමි වන්නේ රාජගුරුප්‍රසාදි ධූරයට යි. අපෝස්තුලුවරුන්ගේ තනතුරට පත්වන එතුමෝ පූජකවරයේ සියලු බලතල සහිත ව පූජක වරමේ පූර්ණත්වය ලබන්නෝ ය. රාජගුරුප්‍රසාදිවරුන් පත් කරනු ලබන්නේ ශුද්ධෝත්තම පාප්වහන්සේ විසිනි. උන්වහන්සේ සමග සාමූහික ව එතුමන්ලා ධර්මයත් සදාචාරයත් පිළිබඳව උගන්වන විට නොවරදිනසුළු බව බුක්ති විඳින්නාහ.

**ක්‍රියාකාරකම**

1. මිසම් සේවක පූජාප්‍රසාදිතුමා විසින් ඉටු කරන සේවා **පහක්** ලියන්න.
2. තිල පූජකවරයේ ධූරයන් **තුන** නම් කරන්න.



**ජීවිතයට බිඳක්**

*යාච්ඤාවේ හා වන්දි ගෙවීමේ ස්වකීය ජීවිතයෙන් තාපස තාපසිකාවෝ රෝගීන් සඳහා, ධර්ම දූත සේවය සඳහා කෙතරම් මහත් ආත්ම පරිත්‍යාගයක් කරන්නේ ද? ඔබ එය අගය කරන්න. ඔබ ඔවුන්ගේ කාර්යයන්ට සහාය දෙන්න.*

*ඔබටත් එවැනි දේව කැඳවීමක් තිබේදැයි සිතා බැලුවා ද?*
*දේව කැඳවීම් වැඩි කර දෙන ලෙස දෙවිඳුන් යදින්න. දේව කැඳවීම් ලබා සිටින අයගේ සේවයේ දී පැමිණෙන දුර්පරීක්ෂාවලින් ජය ගැනීමට ශක්තියත්, ඔවුන්ගේ සේවාව සාර්ථක ව කර ගෙන යාමට දෙවිඳුන්ගේ වරප්‍රසාද නිරතුරු දානය කර දෙන මෙන් යාච්ඤා කරන්න.*